කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ

කළමනාකරණ සහකාර ( තාක්ෂණ ) ඛණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව — යොමු අංකය : DTET/04/AO/SOR/M1 — දිනය : 2013.03.06

1.2 අමාත්‍යාංශය : යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය — යොමු අංකය : 2/1/17/2/13 — දිනය : 2013.03.18

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම — යොමු අංකය : DMS/C/05/46 — දිනය : 2012.08.27

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය — යොමු අංකය : EST-2/RECRU/03/2053 — දිනය : 2013.01.24

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය : NSCC/1/44/1/SR — දිනය : 2012.12.24

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය — යොමු අංකය : PSC/EST/8/44/1/2/2013 — දිනය : 2013.04.23

02. **පත්කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

03. **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර ( තාක්ෂණ ) ඛණ්ඩ 2

3.2 ශ්‍රේණි : III, II, සහ I ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා ( NVQ ) මට්ටම 06 යටතට ගැනෙන්නාවූ ද පාඨමාලා කාල සීමාව මාස 13 සහ 24 අතරවූ අදාල තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා නිමකර තිබිය යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MT – 2 – 2006 (ඒ)

5.2 වැටුප් පරිමාණය : රු.14,570–10X170–11X180–6 X 240–14X320–24,170/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු. ) |
|---|---|---|
| III | 01 | රු. 14,570/- |
| II | 12 | රු. 16,450/- |
| I | 23 | රු. 18,490/- |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| රසායනාගාර සහකාර ( තාක්ෂණ විද්‍යාල සඳහා ) | III / II / I | 18 | 1. තාක්ෂණ / කාර්මික විද්‍යාල ශිෂ්‍යයින් හට විද්‍යාගාර පරිහරණය සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම<br>2. තාක්ෂණ / කාර්මික විද්‍යාලවල විද්‍යාගාරයන්හි උපකරණ හා භාණ්ඩ වට්ටෝරු ලේඛණය නඩත්තු කිරීම.<br>3. තාක්ෂණ /කාර්මික විද්‍යාලවල විද්‍යාගාර නිසිලෙස පවත්වාගෙන යාම.<br>4. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| රසායනාගාර සහකාර ( කාර්මික විද්‍යාල සඳහා ) | | 58 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : රසායනාගාර සහකාර ( තාක්ෂණ විද්‍යාල සඳහා ) - 18
රසායනාගාර සහකාර ( කාර්මික විද්‍යාල සඳහා ) – 58

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II සහ I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගැනීමේ ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

**7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :-**

1. භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයක් ඇතුළුව විෂයයන් 04 කට සාමාන්‍ය සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් 06 කින් අ.පො.ස.( සා.පෙ. ) විභාගය සමත්වී තිබීම.

සහ

2. අ.පො.ස.( උ.පෙ. ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියළුම විෂයයන්ගෙන් ( සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර ) සමත්ව තෘතියික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම ( පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්වී තිබීම ප්‍රමාණවත් වේ. )

**7.2.2.2 වෘත්තීය සුදුසුකම් :-** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) 6 වන මට්ටමේ තාක්ෂණ ක්ෂේත්‍රයට අදාල පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම

**7.2.2.3 පළපුරුද්ද :-**

1. රජයේ හෝ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 02 කට නොඅඩු කාලයක් සේවයේ යෙදී පළපුරුද්දක් ලබා තිබීම.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සඳහන් සියළු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.